# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO – 309 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 20/02/2024 පැය 1630

## මාධ්‍ය නිවේදනය

### ගල්කිස්ස සංචාරක පොලිස් ස්ථානය විවෘත කිරීම.

ගල්කිස්ස පොලිස් කොට්ඨාසයේ ගල්කිස්ස වෙරළ පාරේ ඉදිකරන ලද සංචාරක පොලිස් ස්ථානය **වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන්** 2024.02.20 වන අද දින උදෑසන විවෘත කරන ලදි.

මෙරටට පැමිණෙන සංචාරකයින්ට පැමිණි අවස්ථාවේ සිට සංචාරය අවසන් කර සිය රටවල් බලා පිටව යන තෙක් ආරක්ෂාව ලබා දීමට අවශ්‍ය කටයුතු ඉටු කර දීම මෙම සංචාරක පොලිස් ස්ථානය විවෘත කිරීමේ මූලික අරමුණ වේ.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මූල්‍ය අනුග්‍රහයෙන්, "ජපන් ගෙදර" ව්‍යාපෘති ආධාර මත මෙම සංචාරක පොලිස් ස්ථානයේ ගොඩනැඟිල්ල ඉදි කර ඇත.

මෙම අවස්ථාවට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී දොලවත්ත මහතා ,අපරාධ හා රථවාහන දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය ,ප්‍රජා පොලිස් සංචාරක හා ආයෝජන දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහේෂ් සේනාරත්න ඇතුළු නිලධාරීන් මෙන්ම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වැඩබලන සභාපති ශිරන්ත පීරිස් මහතා, අධ්‍යක්ෂ ජෙනරාල් ෂෙරික් ඩීන් මහතා සහ අධ්‍යක්ෂ ජෙනරාල් සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය සුරංගා විතානගේ මහත්මිය ඇතුළු මහත්ම මහත්මීන් රැසක් සහභාගී විය.

මීට සමගාමීව කැස්බෑ පැටවුන් සියයකට අධික ප්‍රමාණයක් මුහුදට මුදවා හැරීම සහ පොලිස් නාවික කොට්ඨාසයේ ජීවිතාරක්ෂක අංශ නිලධාරීන් මඟින් දියේ ගිලීමකදී පුද්ගලයෙකු බේරා ගන්නා ආකාරය පිලිබඳව ප්‍රදර්ශනාත්මකව ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදි.








මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.